(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 8.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 මැයි මස 20 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0014/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 10 ක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) යුද හමුදාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් හා වේතන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී යුද හමුදාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රෙජිමේන්තුවක හෝ කණ්ඩායමක සිටින යුද හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පදනම මත සේවයේ යොදවන ලද යුද හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0015/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා වාර්ෂිකව සිදු වී ඇති රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින්, මාරක රිය අනතුරු සංඛ්‍යාව හා සාමාන්‍ය රිය අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම රිය අනතුරු අතුරින් අධික වේගයෙන් ධාවනය කිරීම හේතුවෙන් සහ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය ධාවනය කිරීම හේතුවෙන් සිදුවී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම අනතුරු හේතුවෙන් මියගිය හා තුවාල ලැබූ හෝ ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙසේ දිවයින පුරා සිදුවන රිය අනතුරු වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 10 ක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) ගුවන් හමුදාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් හා වේතන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ගුවන් හමුදාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රෙජිමේන්තුවක හෝ කණ්ඩායමක සිටින ගුවන් හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පදනම මත සේවයේ යොදවන ලද ගුවන් හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.

අභාවප්‍රාප්ත ගරු රිචර්ඩ් පතිරණ මහතා, හිටපු අමාත්‍ය සහ පාර්ලිමේන්තු මන්ත්‍රී

2.

අභාවප්‍රාප්ත ගරු පියදාස හරිශ්චන්ද්‍ර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3.

අභාවප්‍රාප්ත ගරු ඩික්සන් සිල්වා හෙන්දාවිතාරණ මහතා, හිටපු උත්තර මන්ත්‍රී

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2010 ජූනි මස 08 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 වැනි දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*2



අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) මාසික වැටුප පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(3) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) | රු. 65,000/- |

තවද, මෙම මාසික වැටුප තුළ මීට ප්‍රථම පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති ගෙවල් කුලී දීමනාව ද ඇතුළත්ව ඇති බැවින්, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්) රු. 65,000/- ක මාසික වැටුපට අමතරව 2009.01.01 දින සිට වෙනත් දීමනා සඳහා හිමිකමක් නොමැති බව ද, මෙම පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් නිශ්චය කරනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**